(17)

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 17/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1989 මාර්තු මස 23 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## <u>විනය පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීම</u>

මෙම කාරණය ගැන චක්‍රලේඛ නිකුත් කිරීමෙන් මෙම අමාත්‍යාංශය නිකුත් කර තිබෙන නමුත් විනය පරීක්ෂණවල කටයුතු අවසන් කිරීමේ දී අධික ප්‍රමාදවීම් සිදුවන බව දක්නට තිබේ. මෙම ප්‍රමාදවීම් නිලධරයාටත් ඔහු සේවය කරන සංවිධානයටත් පීඩාකාරී වේ. මේ වූ කලී තවත් ස්වරූපයක තාඩනයකි.

2. එහෙයින් විනය කටයුතු කිරීමේදී අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් එම කටයුතු පිළිබඳ පහත දැක්වෙන කාල නියමය දැඩිලෙස පිළිපැදිය යුතු යැයි තීරණය කර තිබේ.

(අ) වැඩ තහනම් කරනු ලැබ සිටින නිලධරයකුට විරුද්ධව ඉදිරිපත් කෙරෙන චෝදනා පත්‍රය වැඩ තහනම් කළ දින සිට <u>එක් මාසයක් තුළදී</u> නිකුත් කිරීම.

(ආ) පරීක්ෂණ විනිශ්චය සභාවක් අවශ්‍ය වන අවස්ථාවන්හිදී චෝදනා පත්‍රයට පිළිතුරු ලැබ <u>සති දෙකක් තුළදී</u> පරීක්ෂණ විනිශ්චය සභාව පත් කිරීම.

(ඇ) විනිශ්චය සභාව පත් කරනු ලැබූ දින සිට <u>මාස තුනක් තුළදී</u> විනය පරීක්ෂණය අවසන් කිරීම.

3. ඉහත දක්වා ඇති කාල නියමය ප්‍රකාර ක්‍රියා කිරීමෙහි ලා ප්‍රමාදයක් සිදු වුවහොත් දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් එම ප්‍රමාදයට හේතු පැහැදිලි කළ යුතුය. එම හේතු පැහැදිලි කිරීම සතුටුදායක නොවේ නම්, මේ කාරණය දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි සඳහන් කිරීම ලේකම් ගේ වගකීම වන්නේය. දෙපාර්තමේන්තු ප්‍රධානයාගෙන් සිදුවන එබඳු ප්‍රමාද දෝෂ, සාධාරණ සංඛ්‍යාවක් ඉක්මවා යන්නේ නම් එම තත්වය, ඔහුගේ වැටුප් වැඩිවීම් ගෙවීම සාකච්ඡා කරන අවස්ථාවේදී ඔහුට අවාසිදායක තත්වයක් සේ සැලකිය හැකිය.

4. දෙපාර්තමේන්තු විසින් විනය කටයුතු කරනු ලැබීමේදී සිදුවන මෙම ප්‍රමාදවීම්වලට තුඩු දෙන කරුණු අතරින් එකක් හැටියට පෙනියන්නේ අදාළ ඇතැම් ලියකියවිලි අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට සිදුවීමය. එබඳු අවස්ථාවලදී විනය බලධාරියා

විසින් අධිකරණයේ පවරා ඇති නඩුව අවසන් වන තෙක් බලා නොසිට ඒ සමගම දෙපාර්තමේන්තුවේ විනය කටයුතු ද ආරම්භ කළ හැකි වනු පිණිස අදාළ ලියකියවිලිවල සහතික කළ පිටපත් ලබාගෙන තබා ගත යුතුය.

4. මෙම කරුණු සම්බන්ධයෙන් මෙයට ප්‍රථම නිකුත් කරන ලද පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

අංක 77 හා 1973.11.09
අංක 83 හා 1974.04.29
අංක 133 හා 1979.02.08
අංක 186 හා 1981.01.13
අංක 218 හා 1983.04.12

(සිරිල් ගමගේ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.